# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 8,054 — 1934ක්වූ ජූනි මස 1 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.— හතරවෙනි කාණ්ඩය.

උපාධිගනිති.

වර්ෂ 1896යේ අංක 13 දරන ආඥාපණත.

වර්ෂ 1897යේ අංක 7 දරන ආඥාපණතෙන් අමුතුකරන්ට යෙදුන වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතයයි නම්ලත් ආඥාපණතේ අංක 1 දරන වගන්තියේ ප්‍රකාර 1934වරදී දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පවත්වන්ට අදහස්කර තිබෙන පෙරහැර මංගල්‍යය සිරිත් ප්‍රකාර පවතීයයි යන අදහසින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වෙත 1931යේ ලංකාවේ රාජ්‍යමන්ත්‍රණ සභාවේ අංක 93 දරන නියෝගයෙන් එතුමාණන්වහන්සේට ලැබී තිබෙන බලය ප්‍රකාර පනවනලද නියෝගයයි.

ඩී. බී. ජයතිලක,
අභ්‍යන්තර කාර්‍ය්‍ය භාරකාර මන්ත්‍රීතුමා.

වර්ෂ 1934ක්වූ මැයි මස 23වෙනි දින කොළඹ
අභ්‍යන්තර කාර්‍ය්‍ය භාරකාර මන්ත්‍රීතුමාගේ
කන්තෝරුවේදීය.

### දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ පෙරහැර මංගල්‍යය.

### 1896යේ අංක 13 දරන වන්දනාගමන් පිළිබඳ ආඥාපණත යටතේ සම්පාදනයකරනලද ව්‍යවස්ථා.

1. දෙවුන්දර ශ්‍රී විෂ්ණු මහා දේවාලයට පෙරහැර මංගල්‍යය සඳහා යන වන්දනාකාරයන්ට දෙවුන්දර නැවතී සිටීමට අවසර ඇති කාලය දහදවසකි ; එනම්, 1934යේ ජූලි මස 24වෙනි දින පටන් අගෝස්තු මස 2වෙනි දින දක්වා පමණකි. මුලින් කී දිනට මත්තෙන් පැමිණෙන්නාවූ හෝ මෙහි නියම කළ කාලයට වඩා නතරවන්නාවූ වන්දනාකාරයෝ වරදක් කිරීම ගැන වැරදිකාරයෝ වෙත්.

2. පෙරහැර කාලයේදී හෝ ඊට කලින් දෙවුන්දර හෝ ඒ අසල බෝවෙන, පැතිරෙන නොහොත් වසංගත ස්වභාවයේ යම් රෝගයක් පටන්ගත්තොත් නැත්නම් උප දිසාපතිතුමාගේ කල්පනාවේ හැටියට වන්දනාකාලයේදී දෙවුන්දරට පැතිර එන්නට පූර්වයෙන් දකුණු පළාතේ වෙනයම් ස්ථානයක එබඳු රෝගයක් පවතීනම් වන්දනාගමන තහනම්කරන්නට හෝ පෙරහැර කාලය අවසානවූයේයයි ප්‍රකාශකරන්නටද දෙවුන්දරට [illegible] ඇවිත්සිටි සියල්ලන්ටම වහාම ඉන් පිටවී තමතමන්ගේ [illegible] හැරීයන්නට නියමකරන්නටද ඔවුන් යායුතු මාර්ග මේ මේයයි නියමකරන්නටද උප දිසාපතිතුමාට නීති ප්‍රකාර බලය තිබේ. උප දිසාපතිතුමාගේ ආඥා නොසලකන යමෙක් ඇද්ද මෙහෙතුම වරදක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

3. බෝවෙන නොහොත් පැතිරෙන රෝගයකින් පෙළෙමින් ඒ බව වහාම සනීපාරක්ෂක පරීක්ෂකතුමාට හෝ වෛද්‍ය මූලාදෘනිතුමාට හෝ ඔවුන් නැතිවිට, දෙවුන්දර සිටින පොලීසියේ මූලාදෘනීන් අතුරෙන් උසස් මූලාදෘනියාට හෝ නොදන්වා සිටින යමෙක් ඇද්ද, තවද එබඳු රෝගයක් පවතින බැව් වසංකරගැනීමට අනුබලදෙන්නාවූ හෝ ආධාරකරන්නාවූ යමෙක් ඇද්ද එබඳු අය අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

4. පෙරහැර මංගල්‍යය පවතිනා අතර මස්, මාලු හෝ එළවලු විකිණීම පිණිස උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතුමා විසින් හෝ වෙන්කොට තබා තිබෙන ස්ථානයේ හැර දෙවුන්දර වෙන කිසියම්තැනක ඒ ද්‍රව්‍ය යමෙක් විකුණන්නේද, සනීපාරක්ෂා පරීක්ෂකතුමා විසින් හෝ වෛද්‍ය මූලාදෘනිතුමා විසින් හෝ ඔවුන් නැතිවිට මුදලිතුමා විසින් හෝ දෙවුන්දර සිටින පොලීසියේ මූලාදෘනීන් අතුරෙන් උසස් මූලාදෘනියා විසින් හෝ කෑමට නුසුදුසු යයි කියන මසක් හෝ කිසියම් ආහාරපානාදියක් යමෙක් විකුණන්නේද එබඳු අය අපරාධයක් කිරීම ගැන වරදකාරයෙක් වේ.

5. පෙරහැර මංගල්‍යය පවතිනාතර දෙවුන්දර විකිණීමට තබන සියලුම කැවුම්, රසකැවිලි හා අනිකුදු ආහාර ද්‍රව්‍ය මනාසේ සාදනලද වීදුරු පෙට්ටිවල හෝ මැස්සන්ට ඇතුල්වීය නොහැකි වෙන භාජනවල තබාගත යුතුයි. එබඳු සියලුම භාජන පවිත්‍රව තබාගත යුතුවේ.

6. උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතුමා විසින් මැනවැයි පිළිගන්නාලද ස්ථානයක එසේ පිළිගන්නාලද ආකාරයකට සෑදෙන වැසිකිළි පහසු කැනීම ගැන පෙරහැර මංගල්‍යය පවත්වන භූමියේ අයිතිකාරයා හෝ (එය බද්දට දී තිබේනම්) බදුකාරයා වගකිය යුත්තේය. "එබඳු වැසිකිළි පෙරහැර මංගල්‍යය පවත්වන මුළු කාලයට පවතින්ට සෑහෙන අන්දමට තිබිය යුතුයි. ඒවායේ සැලැස්මවල් (ප්ලෑන්) හා විස්තර උප දිසාපතිතුමාගේ හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධානතුමාගේ අනුමතය ලබාගැනීම පිණිස පෙරහැර පටන්ගන්නට දසදිනකටවත් මත්තෙන් යැවිය යුතුයි.

ඒ ඇරත් කොහුබත් හෝ වැලිද උප දිසාපතිතුමා විසින් මැනවැයි පිළිගත් වර්ගයක රෝග විෂබීජ නසන බෙහෙත්ද සම්පාදනය කිරීම ගැන හා පෙරහැර මඩිගල්‍යය පවත්වන තෙක් දවසකට දෙවරක්වත් අශුචි ඉවත්කිරීම හා වැසිකිළි ශුද්ධකිරීම ගැනද හෙතෙම වගකිය යුත්තේය. අයිතිකාරයා හෝ බදුකාරයා මේම නියෝගයේ විධිවිධානවලින් යමක් කඩකළේනම් හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

7. උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාව විසින් හෝ පෙරහැර මඩිගල්‍යය පවත්වන භූමිය අයිතිකාරයා විසින් හෝ බදුකාරයා විසින් හෝ ශරීරකෘත්‍යයන් සඳහා වෙන් කොට තිබෙන ස්ථාන හැර වෙන කිසියම් ස්ථානයක් පෙරහැර මඩිගල්‍යය පවත්වන කාලයේදී පාවිච්චිකරන්නාවූ හෝ පහ රණලද අශුචි පස්වලින් හෝ වැලිවලින් වසාහොදමන්නාවූ යමෙක් ඇද්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

8. සියලුම පිදුරු, කැලිකසල, ගොම හෝ වෙනයම් රොඩු ආදිය පෙරහැර මඩිගල්‍යය පවත්වන අතර දිනපතා වරක් වත් එකතුකොට ඉවත්කිරීමද, එබඳු කැළිකසල රොඩු ආදිය උප දිසාපතිතුමා විසින් හෝ සනීපාරක්ෂක සභාවේ ප්‍රධාන තුමා විසින් මැනවැයි පිළිගන්නාලද ස්ථානයක පුළුස්සාදැමීම හෝ වළලාදැමීම පෙරහැර මඩිගල්‍යය පවත්වන භූමිය අයිති කාරයාට හෝ (එය බද්දට දී තිබේනම්) බදුකාරයාට භාර වැඩකි. මෙම නියෝගයේ විධිවිධානවලින් යමක් නොකොට හෝ නොකරඹා පැහැරඅරින යම්කිසි අයිතිකාරයෙක් හෝ බදුකාරයෙක් ඇද්ද හෙතෙම අපරාධයක් කිරීම ගැන වරදකාරයෙක් වේ.

9. මාතර සිට තංගල්ලට යන මහපාරේ සහ දේවාලේට යන පාරේ කානුවේ පටන් අඩි 12ක් ඇතුළත බිමේ පෙරහැර මඩිගල්‍යය පිළිබඳව කඩමඩුවක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දෙවුන්දර නොකැදිය යුතුයි. තවද වෙළඳාම්බඩු මැස්සක් තබාගත් යම්කිසි කෙනකු, වෙළෙන්දකු හෝ මිලට විකුණන්නකු එබඳු බිම ඇතුළත විකිණීම පිණිස බඩු තබා ගෙන සිටිය යුතුනැත. මේ නියෝගය කඩකරන යමෙක් ඇද්ද හෙතෙම අපරාධයක්කිරීම ගැන වරදකාරයෙක් වේ.

10. රථවාහනාදිය නැවතීමට හෝ මඩිගල්‍යය බලන්නට එන්නන්ගේ ඉඩ පහසුවට මාතර උප දිසාපතිතුමා විසින් වෙන්කර තිබෙන යම් බිම්කොටසක් ඇද්ද දෙවුන්දර එබඳු ස්ථානයේ කඩ මඩුවක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් තැනියයුතු නොවේ. යම් කිසිවෙක් මේ නියෝගයේ විධි විධාන කඩකළේනම් හෙතෙම අපරාධයක්කිරීම ගැන වරද කාරයෙක් වේ.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

වර්ෂ 1934රේ අප්‍රේල් මස 27වෙනි දින නිකුත්කරන්ට යෙදුන නොම්මර 8,045 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ තුන වෙනි කොටසේ 286 සහ 287වෙනි පිටුවල පලකර තිබෙන නොම්බර 233 දරණ දැන්වීමේ අඩංගු නොම්බර 6,655, 8,375, 8,804, A 51, 7,356, A 143 සහ 7,066 දරණ මුල් සිතියම්වල සඳහන් බිම්කැබෙලි වර්ෂ 1934රේ ජූනි මස 15වෙනි දිනට විකුණනු හෝ වෙන අන්දමකින් තීන්දුකරණු හෝ නොලැබී කල්දමන්ට යෙදෙන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1934ක්වූ මැයි මස 25වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුනවර්ධන,
මහනුවර පලාතේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

**Mullaittivu No. 69.**—උතුරු දිසාවේ මුල්ලද්දුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1934ක්වූ ජූලි මස 23වෙනි දිනවූ සඳුදා පෙරවරු 11ට වවුනියා උසාවියේ ගොඩනැගිල්ලේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු දිසාවේ වවුනියා දකුණු සිංහල පලාතේ කිලක්කමුල්ල දකුණු සහ සින්නසෙට්ටිකුලම් නැගෙනහිර සහ බස්නාහිර කොටසේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

මුල් සිතියමේ නො. 5,965. ගම—කිලක්කමුල්ල දකුණු සිංහල පලාතේ ඊරප්පෙරියකුලම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 2 | ගන්ගොඩවත්ත | — | ඔවුන්න | ලොකු කැලෑ ඉඩම | 1 3 21 | 23 |
| 5 | එම | — | එම | එම | 2 1 38 | 24·50 |
| 6 | එම | — | එම | එම | 2 0 7 | 22 |
| 8 | එම | — | එම | එම | 2 0 9 | 20 |
| 11 | එම | — | එම | එම | 2 0 8 | 25 |
| 12 | එම | — | එම | එම | 1 3 33 | 20 |
| | මුල් සිතියමේ නො. 8,423. ගම—නෙඩුංකුලම. | | | | | |
| 1 | කට්ටුපත්කැලේ ඉයිනියගහවත්ත | තොහොන් මැනික්රාලගේ සුද්දහාමි | ඔවුන්න | මුඩුබිම | 0 1 7 | 20 |
| | මුල් සිතියමේ නො. 7,055. ගම—සින්නසෙට්ටිකුලම් නැගෙනහිර සහ බස්නාහිර පලාත, පලයඋරුව. | | | | | |
| 1 | සියඹලාගහවත්ත | රතනවීදුගේ ගේ කන්ද | ඔවුන්න | කැලෑඉඩම සහ එළි මහත් ඉඩම | 0 3 12 | 20 |

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මුල්ලද්දුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1934ක්වූ මැයි මස 25වෙනි දින කොළඹ ඉඩම්
පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වර්මන.

---

**Mullaittivu No. 74.**—උතුරු දිසාවේ මුල්ලද්දුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1934ක්වූ ජූලි මස 21වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 10ට සෙට්ටිකුලමේ රෙස්ට්හවුස්එකේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු දිසාවේ මුල්ලද්දු දිස්ත්‍රික්කේ වවුනියා දකුණු පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 13ක්.

මුල් සිතියමේ නො. 5,323. ගම—සින්නසෙට්ටිකුලම් නැගෙනහිර සිංහල පලාත, කාච්චුපුලියන්කුලම.

අයිතිකමකියන්නා—ඔවුන්න.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 2 | පලුගහඉඩම | (1) විකිරාලගේ අප්පුරාල, (2) සිරාලගේ කදිරහේ, (3) කිරිනසිඤ්ඤරාලගෙ පුංචිරාල | කැලෑඉඩම | 9 1 6 | 22 |
| 3 | එම | — | මහඇලට වෙන්කර තිබෙන කැලෑ ඉඩම | 1 3 24 | —* |
| 4 | නම්මින්නාගහඉඩම | — | එම | 0 1 35 | —* |
| 5 | එම | සෙල්ලවන්නිහාමි ලේකමගේ මුදලිහාමි | කැලෑඉඩම | 1 3 36 | 28 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | අක්කරයකට මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | **මුල් සිතියමේ නො. 7,380. ගම—උළුක්කුලම.** | | | | | | |
| 1 | දිවුල්ගහඉඩම .. | — .. | පාරදිගට වෙන්කර තිබෙන එළිකලඉඩම | 0 | 0 | 1 | —* |
| 2 | එම .. | ඒ. කේ. බද්දරුල මරදම් මබුව .. | එළිකලඉඩම .. | 0 | 2 | 10 | 20 |
| 3 | දඹකහවතන නොහොත් දිවුල්ගහඉඩම | එම අය සහ වී. කන්දෙන් මරදම් මබුව | එම සහ පාරේ කොටසක් .. | 0 | 1 | 22 | 25 |
| 4 | දඹගහවත්ත .. | — .. | අඩිපාරට වෙන්කර තිබෙන ඉඩම | 0 | 0 | 25 | —* |
| 5 | දිවුල්ගහවත්ත .. | — .. | අවුරුදු 20ක් පමණ වයස ඇති පොල්ගස් 4ක් තිබෙන එළිකල ඉඩම නො. 246,193 දරන සිතියමේ සඳහන් ඉඩම් අයිතිකාරයින් වන කේ. කිරිඑතනි සහ තවත් අයෙක් විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන ඉඩම | 0 | 0 | 15 | 16† |
| 6 | දඹගහවත්ත .. | වී. කන්දෙන් උළුක්කුලම .. | එළිකලඉඩම සහ පාරේ කොටසක් | 0 | 2 | 11 | 20 |
| | **මුල් සිතියමේ නො. 8,096. ගම—පලයඋගුරුව.** | | | | | | |
| 1 | නුගගහවත්ත .. | කින්දුනසිඬේගේ කපුරුවා පලය උගුරුව | ගොඩකු කැලෑඉඩම .. | 2 | 0 | 2 | 25 |
| 2 | එම .. | පුංචාහසිඬේගේ කන්ද පලය උගුරුව | එම .. | 2 | 0 | 2 | 25 |
| 4 | පලුගහකැලේ .. | — .. | කටුකැලෑඉඩම සහ කුඹුර .. | 1 | 1 | 0 | 25 |

* තහනම් ඉඩම් (විකිනීමට නොවේ).

† සාමාන්‍ය රෙගුලාසි 812 යටතේ බේරුම්කරදීම පිණිස.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මුල්ලද්දුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

මේ 1934ක්වූ මැයි මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඉඩම්වල බද්ද විකිනීම සඳහා දැන්වීමයි.

උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම්වල 99 අවුරුද්දේ බද්ද ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට මේ 1934ක්වූ ජූලි මස 20වෙනි දිනවූ සිකුරාදා පස්වරු 2කට කැකිරාවේ ගම්සභා නඩුශාලාවේදී වෙන්දේසිකර විකුණනු ලැබේ. වැඩි මුදලට බද්ද ඉල්ලුම්කරන්නා බද්දෙහි ගැනුම්කාරයා වන්නේය.

බද්දෙහි කොන්දේසි උතුරු මධ්‍යම පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඉඩම්වල සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

නුවර කලාවිය දිස්ත්‍රික්කයේ දකුණු කලාගම්කෝරළේ කුඩා කැකිරාවේ පිහිටා තිබෙන බිම්කට්ටි 8ක්.

අත්තිම ගම් සිතියමේ නො. 908. ගම—කුඩාකැකිරාව.

| බිම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | ඉල්ලුම්කාරයා. | බිම් ප්‍රමාණය, අ. රූ. ප. | | | බිම්කට්ටියකට තක්සේරු ගණන, රු. | ශ. | අවුරුද්දකට බද්ද, මෙය අවුරුදු 33කට වරක් වෙනස් කරනු ලැබේ, රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 77H | කඩවිදිය .. | මුඩුබිම .. | ඒ. ඇම්. අප්පුහාමි .. | 0 | 0 | 10·22 | .. 40 | 0 | .. 30 | 0 |
| 104H | කාලු .. | එම .. | — .. | 0 | 0 | 5·19 | .. 20 | 0 | .. 15 | 0 |
| 104H1 | එම .. | එම .. | — .. | 0 | 0 | 5·22 | .. 20 | 0 | .. 15 | 0 |
| 104H2 | එම .. | එම .. | — .. | 0 | 0 | 5·44 | .. 20 | 0 | .. 15 | 0 |
| 104H3 | එම .. | එම .. | — .. | 0 | 0 | 5·56 | .. 20 | 0 | .. 15 | 0 |
| 104H4 | එම .. | එම .. | — .. | 0 | 0 | 5·47 | .. 20 | 0 | .. 15 | 0 |
| 104H5 | එම .. | එම .. | — .. | 0 | 0 | 5·62 | .. 20 | 0 | .. 15 | 0 |
| 104A6 | එම .. | එම .. | — .. | 0 | 0 | 5·25 | .. 20 | 0 | .. 15 | 0 |

මේ 1934ක්වූ මැයි මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

මේ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වැල්ලෙවීදියේ සිට වැල්ලට යන අඩි 12ක් පලල ඇති පාර පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "මේ 1876කේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නසිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A. 333. ගම—වැල්ලෙවීදිය මීගමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයයන්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | නල්ගහවත්ත, වරිපනම් නො. 97 ඒ කොටසක් 3වෙනි වැල්ලෙවීදිය | වත්ත (නිස් ඉඩම) | ඩබ්ලිව්. රෙමානිස් ප්‍රනාන්දු, ඩබ්ලිව්. මැගිලින් ප්‍රනාන්දු, ඩබ්ලිව්. සෙලෙස්තිනා ප්‍රනාන්දු, ඩබ්ලිව්. පිලෝමිනා, ප්‍රනාන්දු සහ ඩබ්ලිව්. මරියා ප්‍රනාන්දු, සියල්ලම මීගමුවේ | 0 | 0 | 3·3 |
| 2 | එම .. | පොල්ගස් 5කින් යුත් පොල් ඉඩම | එම .. .. .. | 0 | 0 | 17·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1934ක්වූ ජූලි මස 23වෙනි දින පෙරවරු 9.30ට කතිසමට මීගමුවේ යූ. ඩී. සී. කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒකොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1934ක්වූ මැයි මස 25වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කාල් ඊ. ආන්ට්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—උණගස්වල ගමේ ආණ්ඩුවේ පාඨශාලාවක් ආරම්භකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 176. ගම—උණගස්වල.

| නො. | ඉඩමේ නම. | අනුම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත .. | පොල්ගස් 35ක්ද, පොල්පැල 27ක්ද, පුවක්ගස් 8ක්ද, කිතුල් ගහක්ද, කොස්ගස් 13ක්ද, ගොරක ගහක්ද, කුරුදුවැවිලක්ද, තාවකාලික සෙකෝල ගොඩනැගිල්ලක්ද, ගුරුවරයාට නැවතීමට සාදනලද ගෙවල්ද, වැසිකිලියක් සහ ළිඳක්ද අඩංගු ඉඩම | සමාදාන හඬුකාර තැන්පත් ජී. රොබට් ද සොයිසා මහත්මයා, බද්දෙපිටිය | 0 3 11·8 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූනි මස 29වෙනි දින පෙරවරු 10යේ කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 26වෙනි දින
ගාල්ලේ කච්චේරියෙදීය.

ජේ. ඕ. බ්‍රවුන්,
දි. ප. ආණ්ඩුවේ ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දකුණු පලාතේ මාතර දිශාවේ ගඟබඩපත්තුවේ ගොඩපිටියේ මහමත් පාසැලක් තැනවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. 74. අතිරේකයේ නො. 2. ගම—ගලපිලාගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1B | ලොකුරාලගෙ කොරවුව නොහොත් ගලපිලා ගම ලියද්ද නොහොත් තියඹරුව | (අත්හැරදමනලද) කුඹුර | පානදුගම පදිංචි (1) ඇම්. කේ. ඇම්. සේනු අබ්දුලා මරික්කාර්, (2) එම මොහමඩ් කාසිම්, (3) එම මොහමඩ් ඉබ්‍රාහිම්, (4) ඇම්. ඇන්. ඇම්. මොහම්මදු ඉබ්‍රාහිම්, (5) එච්. ඇල්. ඇම්. මොහම්මදු අලි, (6) ඇම්. කේ. ඇම්. මොහම්මදු මීරා නාච්චිය ගලපිලාගම පදිංචි, (7) ඇස්. ඇල්. ඇම්. මොහම්මදු ඉස්මායිල් මත්තිච්චම්, (8) ඒ. ඇම්. අයිෂෙ උම්මා සහ කරාපිටද්දේ පදිංචි, (9) ඇස්. ඇල් ඇම්. අහමදු කාසිම් | 0 0 1·3 |
| 2A1 | ලොකුරාලගෙකුඹුර නොහොත් ගලපිලාගමලියද්ද නොහොත් තියඹරුව | (අත්හැරදමනලද) කුඹුර, අවුරුදු 12ක් පමණ වයස ඇති දෙල්ගහක් තිබේ | එම .. .. .. | 0 1 1 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූලි මස 20වෙනි දින පෙරවරු 11යේ කනිසමට ගොඩපිටියේ ගම්සභාශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 24වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇල්. ඇල්. හන්ටර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—ප්‍රසිද්ධ මාවත් දෙපාර්තමේන්තුවේ මාදම්පේ පාරට උවමනා පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

නොම්මර 973 දරණ අවසාන සිතියමෙන් උපුටාගන්නාලද 1වෙනි කොටස. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කුවේ කටුගම්පොල හත්පත්තුවේ යටිකහ දකුනු කෝරලේ ලබ්බුයාය යන ගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 9A1 | ගොඩැල්ලේවත්ත .. | මුඩුබිම .. | ඇස්. ඒ. ඇම්. මොහොමදු, කුලියාපිටිය .. | 0 0 31 |
| 13E1 | ගල්කැටියාවත්ත .. | එම .. | ජේ. එච්. ඒ. ඒබ්‍රහම් ජයතිලක, පල්ලේපිටිය .. | 0 0 24 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූලි මස 5වෙනි දින පෙරවරු 10.30යේ කනිසමට කුලියාපිටියේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේඅයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 23වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ඇන්. ඊ. ආර්නෝල්ඩ්,
කුරුණෑගල දිස්ත්‍රික්කුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

---

## අන්‍ය දැන්වීම.

1907 අවුරුද්දේ 1වෙනි රෙගුලාසියේ 8වෙනි වගන්තියේ 1වෙනි පෙළේ B. අක්ෂරය ධරන වගන්තියපිට දැන්වීමකි.

මෙහි පහත අත්සන්කරන මඩකලපුවේ ආරපත්තුවේ පදිංචි පරමකුට්ටියර් අයියම් පුල්ලෙ වන මා මඩකලපු දිස්ත්‍රික්කමේ කරුන්කොඩිතීවු නොහොත් අක්කරපත්තුවේ දෙමළ භාෂාවෙන් වැඩකරන නොතාරිස්කෙනෙක්ව පත්කරනලෙස අද පටන් තුන්මාසයක් පසුවූ තැන ලංකාවේ රෙජිස්ට්‍රාර්ජෙනරාල්තුමා වෙත අයදුම්පතක් යැවීමට අදහස් කරන බව මෙයින් මහජනයාවෙත දන්වමි.

ආරපත්තු, මඩකලපුව, අප්‍රේල් 1934.

P. Aiyampillai.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.